# ඉන්දු ආර්ය භාෂා ලෙස සංස්කෘත හා හින්දී භාෂාවන්ගේ අක්ෂර මාලා අතර දැකිය හැකි විෂමතා පිළිබඳ අධ්‍යයනයක්

*අසිත, පූජ්‍ය සෙවනගල* [1]

ඉන්දු ආර්ය භාෂා ලෙස සැලකෙන සංස්කෘත භාෂාවෙහි සහ හින්දී භාෂාවෙහි අක්ෂර මාලාද්වය අතර ඇති විෂමතා සහ එහිලා බලපෑ සාධක පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. ලෝක භාෂා වර්ගීකරණයෙහිදී වාග්වේදීහු '**කේන්ටුම්**' හා '**ශතම්**' ලෙස භාෂා ගණ දෙකකට බෙදා දක්වති. ආර්ය හෙවත් ඉන්දු ඉරාණීය භාෂා ශාඛාව ඉන් ශතම් ගණයට අයත් වෙයි. එම ශාඛාව ඉන්දු ආර්ය සහ ඉරාණීය වශයෙන් අනුශාඛා දෙකකට බෙදනු ලැබේ. ඉන්දු ආර්ය භාෂා පවුලෙහි විකාශයට අනුව පුරාතන ඉන්දු ආර්ය භාෂා, මධ්‍යතන ඉන්දු ආර්ය භාෂා සහ නූතන ඉන්දු ආර්ය භාෂා ලෙස යුගත්‍රයකට බෙදනු ලැබේ. සංස්කෘත භාෂාව පුරාතන ඉන්දු ආර්ය යුගයටත් හින්දී භාෂාව නූතන ඉන්දු ආර්ය යුගයටත් අයත්වේ. පුරාතනයේ සිට නූතනය දක්වා ඉන්දු ආර්ය භාෂා විකාශයෙහිදී සංස්කෘත සහ හින්දී භාෂා අතර විෂමතා රැසක් දක්නට ලැබේ. මෙහිදී අක්ෂර මාලාද්වය අතර දක්නට ලැබෙන විෂමතා කෙරෙහි අවධානය යොමු කෙරිණ. ඒ අනුව අක්ෂර මාලා අතර විෂමතා රැසක් දක්නට ලැබිණ. සංඛ්‍යාත්මක විෂමතා සහ උච්චාරණමය විෂමතා රැසක් මෙන්ම සංකේතාත්මක විෂමතා කිහිපයක්ද අනාවරණය විය. මෙම විෂමතා ඇති වීමෙහිලා සාධක අධ්‍යයනයෙහිදී පෙනීගිය මූලික සාධකය භාෂා පරිණාමයයි. ඊට අමතර ව උත්තර භාරතය වෙත සිදු වූ සංක්‍රමණ සහ ආක්‍රමණ මෙන්ම විදේශීය සංචාරද එහිලා බලපෑ සාධක ලෙස අනාවරණය විය. අරාබි, පාර්සී, උර්දූ, ද්‍රවිඩ සහ ඉංග්‍රීසි ආදි භාෂා මෙහිදී බලපෑම් කළ භාෂා ලෙස පෙන්වාදිය හැකිය. මෙම අධ්‍යයනයෙහිදී ඉන්දු ආර්ය භාෂා ලෙස සංස්කෘත සහ හින්දී යන භාෂාද්වයෙහි අක්ෂර මාලා අතර විෂමතා දක්නට හැකි බවත් එහිලා යථෝක්ත සාධක බලපෑ බවත් නිගමනය විය. අධ්‍යයන ක්‍රමවේද ලෙස උක්ත භාෂා පිළිබඳ රචිත ව්‍යාකරණ ග්‍රන්ථ, වාග්විද්‍යාත්මක ග්‍රන්ථ, ශාස්ත්‍රීය නිබන්ධන සහ අන්තර්ජාලය විමර්ශනාත්මකව අධ්‍යයනය කරන ලදි.

**ප්‍රමුඛ පද :** අක්ෂර මාලාව, භාෂා පවුල, විෂමතා, සංස්කෘත භාෂාව, හින්දී භාෂාව

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*kuruwita.sewanagala@gmail.com*